නිපුණතාව 8 - නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 8.1 - නිදහසින් පසු ව්‍යවස්ථා සම්පාදනයට පසුබිම් වූ සාධක විස්තර කරයි.

හැඳින්වීම - වසර 133ක දිගු ඉතිහාසයක් මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය කිරීටයෙන් 1948 දී අප නිදහස ලැබුවද ,නිදහස ලැබීමෙන් පසුවද මෙරට ක්‍රියාත්මක වූයේ ඔවුන් විසින් හඳුන්වා දෙන ලද සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
සෝල්බරි ආණ්ඩුක්‍රමය වෙස්ට්මිනිස්ටර් ආකෘතියට අනුව සකස් කරන ලද එකක් බව බොහෝ දෙනාගේ මතයයි.එනම් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ අංග ලක්ෂණ සහිත ආණ්ඩුක්‍රමයකි.එම අංග ලක්ෂණ වන්නේ,

1.ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ කේන්ද්‍රීය ස්ථානය පාර්ලිමේන්තුවට හිමිවීම.
2.පාර්ලිමේන්තුවට වග කියන කැබිනට් මණ්ඩලයක් පැවතීම.
3.පාර්ලිමේන්තුව නෛතික වශයෙන් උත්තරීතර වීම.
4.ආණ්ඩුව පාර්ලිමේන්තුව මගින් පාලනය වීම.
5.ආණ්ඩුව පාර්ලිමේන්තුවට වගකීම.
6.කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ක්‍රමය මත පදනම් වූ ද්වි පක්ෂ ක්‍රමය

ඉහතින් දක්වා තිබෙන කරුණු සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ ද තිබෙන බැවින් සෝල්බරි ආණ්ඩුක්‍රමය වෙස්ට්මිනිස්ටර් අංග ලක්ෂණ සහිත ආණ්ඩුක්‍රමයකි.

ඉහත කරුණුද අදාළ කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1.සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ ගැබ් වී ඇති වෙස්ට්මිනිස්ටර් අංග ලක්ෂණ සාකච්ඡා කරන්න.
2.සෝල්බරි ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට හේතු වූ කරුණු පෙන්වා දෙන්න.
3.සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළින් හඳුන්වා දෙන ලද සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය පිළිබඳ රචනයක් ලියන්න.